# ශ්‍රී ලංකාවට අයත් සාගර කලාපයෙන් හමු වූ පැරණි යාත්‍රා සුන්බුන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ජී.ඩබ්.එල්.යූ.එම්. සේනාරත්තන[1]

ප්‍රමුඛ පදඃ ශ්‍රී ලංකා සාගර කළාපය, යාත්‍රා කොටස්, වර්ගීකරණය, ඉතිහාසය, සංවර්ධනය

## හැඳින්වීම

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ දූපත් රාජ්‍යක් වන අතර එය පුරාණයේ සිටම ජාත්‍යන්තර නාවික ගමනාගමන මාර්ගවල ප්‍රධාන මධ්‍යස්ථානයක් වී ඇත. ශ්‍රී ලංකාවේ පිහිටීම, වරායවල් වල පිහිටීම,ස්වාභාවික සම්පත් ඒ සඳහා බලපෑවේ ය. ඒ නිසා ලෝකයේ සිවුදිගින් බොහොමයක් නෞකා ශ්‍රී ලංකාවේ වරායවල් වෙත සේන්දු වීම සිදු විය (ආටිගල,ලැබරෝයි,නඩේසන්,පරණවිතාන 1964). වසර ගණනාවක් මෙලෙස නෞකා ගමන් කිරීම නිසා විශාල ලෙස නාවික අනතුරු සිදුවීම් ද රට වටා මුහුදු ප්‍රදේශවලින් වාර්තා වී තිබේ (RamkrishnaTodkar; 2021). එවැනි නෞකා, ඉතා වටිනා පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුක්ත වන අතර, ඒවා ශ්‍රී ලංකාවේ සාගර පුරාවිද්‍යාත්මක උරුමයක කොටසක් වේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ,ශ්‍රී ලංකාවට අයත් නාවික සැ 12 ක මුහුදු ප්‍රදේශය තුළ හඳුනාගත හැකි යාත්‍රා සුන්බුන් හමුවන ස්ථාන හඳුනාගෙන, ඒවායේ පිහිටීම, ව්‍යාප්තිය පිළිබඳ විමර්ශණයක් සිදු කිරීමයි. පර්යේෂණය වැදගත් වන්නේ එම ස්ථාන ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය තවදුරටත් අවධානයට ගැනීම සහ දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා ආකර්ෂණීය ස්ථාන වශයෙන් ඒවා සංවර්ධනය කිරීම සඳහා දරණ දායකත්වය නිසාය.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයට සඳහා ද්විතියක දත්ත මූලාශ්‍ර භාවිතා කරන ලදි. National Shipwreck Database දත්ත භාවිතා කළ අතර, අමතරව විද්‍යුත් ලිපි, පර්යේෂණ ලිපි සහ වෙබ් මූලාශ්‍ර මගින් දත්ත රැස් ඇත. එම දත්ත සංඛ්‍යාත්මක දත්ත විශ්ලේෂණය ඇසුරින් විශ්ලේෂණය කර, ශ්‍රී ලංකා මුහුදු ප්‍රදේශවල හඳුනාගත හැකි යාත්‍රා සුන්බුන් පිළිබඳ විමර්ශණයක් සිදු කර ඇත.

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
gw.lakminiumesha@gmail.com

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

අධ්‍යයනයෙන් ලබා ගත් දත්ත වලට අනුව දැනට ශ්‍රී ලංකාව වටා මුහුදු ප්‍රදේශයෙන් නාවික යාත්‍රා 115 ක දත්ත හඳුනාගෙන ඇත. ඒ නාවික යාත්‍රා වර්ග 13 ක් යටතේ වර්ග කළ හැකිය. "වාෂ්ප නෞකා" ගණයෙහි යාත්‍රා 19 ක් ඇත."

එස්.එස් රැන්ගුන් ලෙස හඳුනාගෙන යාත්‍රාව වාෂ්ප නෞකා සනයට අයත් වේ. සමස්ත මගී ප්‍රවාහන නෞකා ගණන 06 කි. 40m ගැඹුරේ තිබූ "එස් එස් පර්සියස් " නෞකාව මේ යටතේ දැක්විය හැකිය. ශ්‍රී ලංකාව වටා මුහුදේ, ලෝක යුධ සමයේ ආරක්ෂක කටයුතු සඳහා භාවිතා

කරන ලද හමුදා යාත්‍රා කොටස් ද දැකගත හැකිය. එවැනි යාත්‍රා 09 කි. තොග ප්‍රවාහන නෞකා 03 ක් සහ සාමාන්‍ය භාණ්ඩ ප්‍රවාහන නෞකා 17 ක කොටස් හඳුනාගෙන ඇත. එම්.වී. ඇස්ටෝරියා එවැනි භාණ්ඩ ප්‍රවාහන නෞකාවකි. සමස්ථ යාත්‍රා අතුරින් ප්‍රවාහන නෞකා හමුවන එකම යාත්‍රාව එච් .එම් .එස් හර්මේස් නමින් හඳුන්වන භාණ්ඩ ප්‍රවාහන බත්තල් (barge) ලා කොටස් 08ක සුන්බුන් හඳුනාගත හැකි අතර මඩකළපුව හා කොළඹ මුහුදෙන් වැඩි වශයෙන් හමු වේ. මෙතෙක් හමු වූ සමස්ත මෝටර් යාත්‍රා ප්‍රමාණය 03කි."ලී සහ වාශ්ප රුවල් " 08ක් ඇත. ගොඩවාය ගවේෂණයෙන් ආසියාවේ පැරණිම ලී රුවල් සාධකය හමු වේ. ලෝක යුධ සමයේ අනතුරට ලක් වූ "ගුවන් යානා කොටස් 08 ක් " හඳුනාගෙන ඇත."ලෝහ බඳ සහිත නෞකා (steel hull) කොටස් 07 ක් ද "ධීවර බෝට්ටු" යාත්‍රා 02 ක කොටස් සහ සාමාන්‍ය නැව් කොටස් 24 ක සාධක ඇත. කොළඹ, ගාල්ල, මාතර, හම්බන්තොට ආදි ප්‍රදේශ රැසක යාත්‍රා සුන්බුන් දැකගත හැකිය. මේ ආකාරයෙන් සමස්ත යාත්‍රා 115ක්, ඒවායේ වර්ගය අනුව අධ්‍යනය කළ හැකිය. මෙම යාත්‍රා හමු වූ ප්‍රාදේශීය මුහුදු කළාප අනුව වර්ග කළ හැකිය. අම්පාර මුහුදු ක්ෂේත්‍රයේ යාත්‍රා 09 ක්, මඩකළපුව ආශ්‍රිතව 11 ක්, ත්‍රිකුණාමලය ආශ්‍රිතව 13 ක්, පුත්තලම හා මන්නාරම ආශ්‍රිතව යාත්‍රා කොටස් 06 ක්, යාපනය 02 සහ මුලතිව් ආශ්‍රිතව 07 ද හමු වී ඇත. වැඩිම යාත්‍රා ප්‍රමාණයක් ගාල්ල හා කොළඹ මුහුදු කළාපවලින් හමු වන අතර එය කොළඹින් 27 ක් සහ ගාල්ලෙන් 26 ක් බැගිනි. හම්බන්තොට ආශ්‍රිතව 07 ක් සහ ගම්පහ ආශ්‍රිත මුහුදේ යාත්‍රා 07 ක සාධක ලැබේ. සමස්ත යාත්‍රා සංඛ්‍යාව 115 කි. මෙය ප්‍රතිශතයක් ලෙස ගණනය කලහොත් මුලතිව්, හම්බන්තොට, ගම්පහ ආශ්‍රිතව සමස්තයෙන් 6% බැගින්, කොළඹ මුහුදු කළාපයේ 23% ,ගාල්ල මුහුදේ 22% ක්, යාපනය මුහුදේ 1.7%, මන්නාරම ආශ්‍රිතව මුහුදේ 5% ද, මඩකළපුව 9.3%, ත්‍රිකුණාමලය ආශ්‍රිතව 11% සහ අම්පාර ආශ්‍රිතව මුහුදේ 10 % ද, නියෝජනය කරයි. මෙම දත්ත අනුව, ශ්‍රී ලංකාවේ නාවික යාත්‍රා සුන්බුන් විවිධ දිස්ත්‍රික්ක වල පුළුල්ව පැතිරී ඇති බව පෙනේ. ගාල්ල 27 හා කොළඹ 26 දිස්ත්‍රික්කවල යාත්‍රා සුන්බුන් වැඩිම ප්‍රමාණයක් පවතී. දිස්ත්‍රික්ක අනුව ප්‍රතිශතයන් විවිධ ලෙස වෙනස් වීමද සලකන ලදී. කොළඹ 23% ගාල්ල 22% අම්පාර 9.3% ත්‍රිකුණාමලය 11% යන අගයන් ඉහළ මට්ටමේ පවතී. මෙම තොරතුරු මත, ගාල්ල, කොළඹ සහ අම්පාර දිස්ත්‍රික්කවල ආරක්ෂාව, සංරක්ෂණය හා සංචාරක සංවර්ධනය සඳහා ප්‍රධාන අවධානය යොමු කළ යුතු

ප්‍රදේශ ලෙස සැලකිය යුතුය. නාවික යාත්‍රා සුන්බුන් පිළිබඳ දත්ත නිතර නවීකරණය කර, පුරාවිද්‍යා සහ නාවික ක්ෂේත්‍රයේ ප්‍රගමනයට දායක කර ගත යුතුය. එය මේ ආශ්‍රිත ක්ෂේත්‍රයේ සංවර්ධන හා ඉදිරි වැඩ කටයුතු වලදී වැදගත් වනු ඇත.

**සමාලෝචනය**

මෙම දත්ත අනුව, ශ්‍රී ලංකාවේ නාවික යාත්‍රා සුන්බුන් විවිධ දිස්ත්‍රික්ක වල පුළුල්ව පැතිරී ඇති බව පෙනේ. ගාල්ල හා කොළඹ දිස්ත්‍රික්කවල යාත්‍රා සුන්බුන් වැඩිම ප්‍රමාණයක් පවතී. දිස්ත්‍රික්ක අනුව ප්‍රතිශතයන් වෙනස් වීමද පැහැදිලි ව දැකගත හැකි කරුණකි. එබැවින් ඉහල ඝනත්වයකින් නාවික යාත්‍රා කොටස් ඇති ප්‍රදේශවල ආරක්ෂාව, සංරක්ෂණය සහ සංචාරක සංවර්ධනය සඳහා ප්‍රධාන අවධානය යොමු කළ යුතුය. දියයට සංචාරක කර්මාන්තය පුළුල් කිරීම සඳහා, ඉහළ ඝනත්වයක් ඇති කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය වැනි ප්‍රදේශ කෙරෙහි වැඩි අවධානයක් ලබා දිය හැකිය. 2025 වසරේ ගවේෂණ මගින් සොයාගත් කොළඹ ආශ්‍රිත නෞකා ක්ෂේත්‍ර ද හැකි තරම් ආර්ථික කටයුතු සඳහා යෙදවිය හැකි ක්‍රම සොයා බැලිය යුතුය. මෙවැනි සොයාගැනීම් නාවික යාත්‍රා සුන්බුන් අධ්‍යයනය හා ආරක්ෂණ වැඩසටහන් සැලසුම් කිරීමේදී මූලික පදනමක් විය හැකි ය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

ආටිගල, ලැබරෝයි, නඩේසන්, පරණවිතාන. (1964). ***ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසය ප්‍රථම භාගය 3***. විද්‍යාලංකර විශ්ව විද්‍යාලය.

Ramkrhan, S.A,Todkar,B.D. (2021). '***Palarchs journal of Archaeology of egypt'***. National Science Foundation – Sri Lanka. (online) https://nsd.ccf.gov.lk/dashboard.php

Archaeology.lk (n.d.) Historical shipwreck sites, (online) Available at: https://www.archaeology.lk/tag/historical-shipwreck-sites/